# ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව (NPC)

# මහලේකම් තනතුර

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව (NPC) විසින් තමන් වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති කාර්ය භාරය ඉටුකිරීම පිණිස, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවෙ හි කාර්යාලයට නායකත්වය සැපයීම අරභයා, එහි මහලේකම් තනතුරට පත් කිරීම සඳහා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලත් නිලධාරීන් හෝ රාජ්‍ය සේවයේ නියුතු ස්වයං උද්යෝගී, ප්‍රතිඵල කෙරෙහි නැඹුරු, ක්‍රියාශූර නිලධාරීන් වෙතින් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයදුම්කරුගේ අපේක්ෂිත පැතිකඩ තොරතුරු :**

(i) ප්‍රථම උපාධියක් සමග පශ්චාත් උපාධි සුදුසුකම් සහ ඉංජිනේරු / ගණකාධිකරණ / ආර්ථික විද්‍යාව / නීතිය / කළමනාකරණ හෝ පරිපාලන ක්ෂේත්‍රයන්හි වෘත්තීයවේදී සුදුසුකම් සහිත නම් වඩා මැනවි.

(ii) දීප ව්‍යාප්ත සේවාවකට අයත් වීම සහ රජයේ සේවයේ අතිරේක ලේකම් / අධ්‍යක්ෂක ජනරාල් තනතුරකට / තත්ත්වයකට නොඅඩු නානාත්තරයක් දැරීම.

(iii) ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි සැකසීම කිරීම පිළිබඳ පළපුරුද්ද, ආයතනික / සංවිධානමය කළමනාකරණය පිළිබඳ හසල දැනුම, කණ්ඩායම් කාර්ය කටයුතු ඉටුකිරීමේ හා තීරණ ගැනීමේ හැකියාව, ප්‍රසම්පාදන චක්‍ර කළමනාකරණය හා පශ්චාත් ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කිරීමේ සුහුරු බව

(iv) අන්තර්ජාතික දායක නියෝජිතායතන සමග ව්‍යාපෘති / ප්‍රසම්පාදන කටයුතු වල යෙදීමෙන් ලත් පළපුරුද්ද අමතර වාසියක් වනු ඇත.

(v) මනා සන්නිවේදන හා අන්තර් පුද්ගල නිපුණතා සහිත ප්‍රතිඵල කෙරෙහි නැඹුරු, ස්වයං උද්යෝගී, අභිප්‍රේරණයන් සහිත කණ්ඩායම් / සමූහ නායකයෙකු විය යුතුය.

**සැ. යු. :** තෝරා ගනු ලබන අයදුම්කරු දැනටමත් සේවයේ යෙදී සිටින අයෙකු වන්නේවී නම්, පත්වීම ස්ථිර පදනම මත වනු ඇති අතර, තෝරාගනු ලබන අයදුම්කරු සේවයෙන් විශ්‍රාමලත් අයෙකු වන්නේ නම්, පත්වීම කොන්ත්‍රාත් පදනම මත වනු ඇත.

**වැටුප් පරිමාණය**

තෝරාගනු ලබන අපේක්ෂකයා, දැනටමත් රජයේ සේවයේ නියුතු අයෙකු නම් ඔහු / ඇය SL-3-2006 වැටුප් පරිමානයට හිමිකම් ලබනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයා, රාජ්‍ය සේවයෙන් විශ්‍රාමලත් අයෙකු වන්නේ නම්, ඔහු / ඇය හට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2018 දරන චක්‍රලේඛය මත පදනම්ව වැටුප් හා වෙනත් දීමනා ලබා ගැනීමට හිමිකම් ලැබෙනු ඇත.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :**

ඉහත සඳහන් සුදුසුකම් හා රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ පළපුරුද්ද මත පදනම්ව, කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබනු ඇත.

**අයදුම් කිරීමේ ක්‍රමවේදය :**

අයදුම්කරුවන් විසින් ස්වකීය ජීව දත්ත තොරතුරු ප්‍රකාශ (CV) සිය අධ්‍යාපනික සහ වෘත්තියවේදී සුදුසුකම්, පළපුරුද්ද, ප්‍රවීණතා, නිපුණතා, රැකියාව හා / අදාල කුසලතා හා වෘත්තීය දක්ෂතා හා ජයග්‍රහන, යනාදිය සඳහන් කිරීමින් ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා විස්තර ද සඳහන් කර පහත ලිපිනයට ලැබෙනසේ **2020 ජූලි මස 24 වන දින හෝ ඊට** පෙර ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම හෝ කළ යුතුය.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ, **"මහලේකම් තනතුර සඳහා අයදුම්පත"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

**සභාපති,**
**ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව,**
**අංක 145, ප්‍රධාන වීදිය,**
**බත්තරමුල්ල.**